


# ඇඬහැරය

**ආයුබෝවන්, සුබ සන්ධ්‍යාවක් වේවා ප්‍රදේශවාසී හිතවතුනි . . . .**

**මේ ඔබ අමතන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක අංශයයි. අද රාත්‍රී 7.30 ට කෘෂිකාර්මික චිත්‍රපටි සංදර්ශනයක් යටිවාවල වෙලකුඹුර අම්බලම අසලදී පැවැත්වේ. ඊට සහභාගී වීම සඳහා ප්‍රදේශවාසී ඔබ සැමට කරනු ලබන සාදර ආරාධනාවයි මේ. . .**

**ස්තූතියි**

මේ විදිහට නවසිය හැට ගණන්වල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිනමා රථ මෙරට ගම් නියම්ගම් පුරා සැරිසරමින්, කෘෂිකාර්මික චිත්‍රපටි පෙන්වමින් ගොවිතැන් බත් කරනා හැටි දැනුවත් කිරීමේ කටයුත්ත කරපු හැටි ඔබට මතක ඇත.

මෙවැනි කටයුතු ග්‍රාමීය මට්ටමින් ඉතා දක්ෂ ලෙස සංවිධානය කළ කෘෂිකර්ම ඕවර්සියර් මහත්මයා ගමේ කැපී පෙනුනු චරිතයක්. ගමේ ඇත්තන්ගේ මඟුල් ගෙදර, මළ ගෙදර, පිරිත් ගෙවල් ආදී හැම අවස්ථාවකටම ඔහු සහභාගි උනා. ගමේ වෙල්යාය, කඩමණ්ඩිය වැනි තැන්වලදී ගොවිතැන් කටයුතු ගැන ගුරුහරුකම් ලබාදුන්නා. බොහෝ දේ පිළිබඳව දැක පුරුද්ද, කළ පුරුද්ද හා පළපුරුද්ද උන්නැහෙට තිබුණා. රෙද්දෙතවාන කියපු ඩැපොක් තවාන් ක්‍රමය කෙටි කලකින් ලංකාව පුරා ප්‍රචලිත උනේ මේ ඕවර්සියර් මහත්වරුන් එදා බොක්කෙන්ම වැඩ රාජකාරි කළ නිසයි. මේක එක උදාහරණයක් විතරයි.

සමහර දවස්වල ඕවර්සියර් මහත්තයා එක්ක පළාතේ ඒ. අයි. මහත්තයත් ගමට ආවා. ඇවිත් ගොවිතැන් කටයුතු ගැන අළුත් අළුත් දේවල් කියා දුන්නා. භව බෝගවලට හානිකරන සත්තු, බෝග වලට වැළඳෙන රෝග, කෘෂි විද්‍යාඥයින් සොයාගන්නා ලද අළුත් අළුත් බෝග වර්ග පිළිබඳව බොහෝ දේ දැනගන්ට ලැබුනේ ඒ. අයි. මහත්තයානේ. ගමේ ඉස්කෝලෙත් සමිති සමාගම් ආදියෙත් මේවා ගැන කතා කලේ ගොවීන් රජුන් කරන්නටයි.

බොහෝ යාන වාහන නොතිබූ ඒ කාලේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාහන ටික ඈත පිටිසර ගම් දනව් පුරා දුෂ්කර මං ඔස්සේ ගමන් කළේ ගම්වල ගොවිතැන් කටයුතු ගැන සොයා බලන්ට ආ ඉහළ නිලධාරි මහතුන්ද සමඟයි. ඒ නිලධාරි මහතුන් ද ගමේ

ඇත්තන්ගේ ගොවිතැන් කටයුතු පිළිබඳව සොයා බැලුවේ බොහොම ලෙන්ගතුකමකින්. ඒ කාලයේ ගම්වල පැවැත්වූ ක්ෂේත්‍ර දින ගොවිපුහුණු පංති ආදිය බොහොමයක් අවසන් උනේ හැමදෙනාටම විනෝදාස්වාදයක් ද ලබාදෙමිනුයි. බොහෝ දෙනෙකුගේ හදවත් තුළ අදටත් මෙවැනි අතීත මතක සටහන් නොමැකී පවතින බව කියන්ට පුළුවන්.

නවසිය හැත්තෑහතෙන් පසු එවකට පැවති රජය විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දුන් නිසා පිටරටින් විච්චූරන ආහාර ද්‍රව්‍ය ගෙන්වීමට දොර ඇරුනා. ඒ කාරනා නිසා ගොවිතැනට සමාජයෙන් තිබුණු සැලකිල්ල එහෙම නැතිනම් පිළිගැනීම අඩු වුනා කිව්වොත් ඒක බොරුවක් නොවෙයි. නවසිය අසූ ගණන්වල අග භාගය වනවිට රජය විසින් ගම්වල සේවය කරපු කෘෂිකර් මඕවර්සියර් මහත්වරුන්ගෙ සේවය අහෝසි කොට ඔවුන් වෙනත් තනතුරු සඳහා ඇතුලත් කලා. මේ හේතුව නිසා ගම් මට්ටමින් කෘෂිකර්මය ගැන තොරතුරු කියාදෙන්න සිටි නිලධාරියා ගමට අහිමි වුණා. මේ නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, ගොවි ජනතාවත් අතර තිබූ සබැඳියාවට අනිසි බලපෑමක් සිදුවුණු බව කවුරුත් පිළිගන්නා කරුණකි.



මේ කාලය වනවිට රූපවාහිනිය ලංකාවට හඳුන්වාදී තිබූ නිසා රූපවාහිනිය ඔස්සේ කෘෂිකාර්මික දැනුම ලබාදෙන වැඩසටහන් නිෂ්පාදනය ආරම්භ උනා. ගොවි බිමට අරුණළු වැනි කෘෂි කාර්මික වැඩසටහන් ජනතාව අතර ජනප්‍රිය උනා. ගෙවත්ත වැනි වැඩසටහන් නිසා ගොවිතැන් නොකරන පිරිස ගොවිතැන කෙරෙහි අවධානය යොමුකළා.

කෙසේ වෙතත්, 2004 දී පත්වුණු සන්ධාන රජය ගොවි ප්‍රජාවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් මීට වඩා සමීප විය යුතු බවට තීරණය කළ අතර, ඊට අදාළ නොයෙක් වැඩසටහන් ක්‍රියාත්මක කළා. 2006 වසරේදී එවකට කෘෂිකර්ම සංවර්ධන ඇමති ගරු චමල් රාජපක්ෂ මහතාගේ සහ එවකට කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශ උපදේශක ආචාර්ය ජෙරී ජයවර්ධන යන මහතුන්ගේ මඟපෙන්වීම මත ක්ෂණිකව ගොවි ගැටළු විසඳා දෙන ගොවි සහන සරණ සේවාව නැමති දුරකථන සේවාව ආරම්භ කළා. මේවනවිට මෙරට ජනතාව අතර දුරකථන භාවිතය ප්‍රචලිත වී තිබෙන නිසා මෙම දුරකථන සේවාව ජනතාව අතර කඩිනමින් ජනප්‍රිය උනා. මෙහි දුරකථන අංකය 1920 යි.

මුලින් ගාස්තු රහිතව ක්‍රියාත්මක වූ මෙම සේවාව දැනට සාමාන්‍ය ගාස්තු ක්‍රමය යටතේ ක්‍රියාත්මකයි. නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන පිළිතුරු සඳහා ගාස්තු අයකිරීමක් නොකරයි. දුරකථනයෙන් යොමුකරන විමසීම් සඳහා එම අවස්ථාවේදී පිළිතුරු සැපයෙන අතර, එසේ පිළිතුරු සැපයීමට නොහැකි වූ විටදී අදාළ කෘෂි විශේෂඥයන් හෝ

ආයතන සම්බන්ධ කර දීමට හෝ තොරතුරු සොයා බලා පැය 72 ක් තුළදී පිළිතුරු ලබාදීමට පියවරගනු ලබයි.

මීට අමතරව ඔබගේ ඇමතුමත් ඊට ලබාදෙන විසඳුමත් පරිගණක ආශ්‍රයෙන් පටිගත කොට ගබඩා කර තැබෙනවා.

ඒ අනුව යොමුකළ ගැටළු පුළුල්ව විමසා බැලීමත් අදාළ අංශ වෙත යොමුකිරීමත් සිදුකෙරෙනවා. මේ වනවිට මෙම සේවය වෙත දිනකට ඇමතුම් 150 - 250 ත් අතර ප්‍රමාණයක් ලැබෙනවා. එය දැනට තිබෙන පහසුකම් අනුව පිළිතුරු ලබාදිය හැකි ඇමතුම් සංඛ්‍යාවක් වන අතර දුරකථන මාර්ග කාර්ය බහුල වීම නිසා බොහෝ දෙනෙකුට මීට සම්බන්ධ වීමට අවස්ථාව අහිමි වීම ප්‍රායෝගික ගැටළුවක් වී තිබෙනවා.

කෙසේ වෙතත් 2014 වසරේදී ආරම්භ කිරීමට නියමිත ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය මගින් මීට වඩා වැඩි අසන්නන් සංඛ්‍යාවකට කෘෂි උපදේශන සේවාව ලබාගැනීමට පහසුකම් සැලසීමට බලාපොරොත්තු වෙනවා.

ඔබ යොමුකරන කෘෂිකාර්මික ගැටළුවලට පිළිතුරු ලබාදීම සඳහා ක්ෂේත්‍රයේ අත්දැකීම් බහුල කෘෂිකර්ම උපදේශකවරු පිරිසක් යොදවා තිබෙනවා. පොල් වගාව සහ අපනයන බෝග පිළිබඳව ද තොරතුරු ලබාදීම සඳහා එම ආයතන වලට සම්බන්ධ දක්ෂ නිලධාරීන් ද මීට සම්බන්ධ කර තිබෙනවා. මීට අමතරව පරිගණක තාක්ෂණය ඔස්සේ මුහුණට මුහුණ ලා සංවාද කළ හැකි ස්කයිප් (SKYPE) ක්‍රමය තුළින්ද ගොවි ගැටළු ඉදිරිපත් කිරීමේ නව ක්‍රමය මේවන විට හඳුන්වා දී තිබෙන අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.agridept.lk වෙබ් අඩවියට ඇතුල් වී 1920 සේවාවට ඔබටත් කෘෂිකාර්මික ගැටළු යොමුකළ හැකියි.

1920 ගොවි සහන සරණ උපදේශන සේවාව පිළිබඳ වර්තමාන වගකීම දරන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන අංශයේ ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානයයි.

මොන අභියෝග පැමිණියත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තවමත් ඔබ සමඟයි.

**මෙම සේවාව තවදුරටත් පුළුල් කර නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් ද උපයෝගී කරගනිමින් ජංගම දුරකථන තාක්ෂණ ක්‍රමවේදයන් සමඟ එක්වීම ඉදිරි ඉලක්කයක් වේ.**

**රජයේ වැඩකරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා මෙම සේවාවන් ඔබට ලබාගත හැකියි.**

**ලිපිනය :- අතිරේක අධ්‍යක්ෂ,
ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය,
ගන්නොරුව,
පේරාදෙණිය.**

**දුරකථන අංක :- 081-2388618
081-2385654**

*කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන අංශයේ අධ්‍යක්ෂ ආචාර්ය රොහාන් විජේකෝන් මහතාටත් එම අංශයේ අතිරේක අධ්‍යක්ෂ ගාමිණී සිසිර කුමාර මහතාටත් කෘෂිකර්ම උපදේශක තිස්ස ධර්මවර්ධන මහතාටත් පාඨක ජනතාව වෙනුවෙන් ගොවිකම් සඟරාවේ අපි ස්තූතිය පළ කර සිටිමු. . .*